**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය – 2017/2018**

**SOC 2220 – ස්ත්‍රී පුරුෂ භාවය පිළිබද සමාජ විද්‍යාව**

**පැ දෙකයි (02)**

**ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.**

---

1. 'ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යනු හුදු ස්ත්‍රී පුරුෂ වෙනස්කම් වලින් ඔබ්බට දිව යන සමාජ නිර්මිතියකි'. අදාළ සංකල්ප භාවිත කරමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

2. i 'පුරුෂාධිපත්‍යය විශ්වීය සංසිද්ධියකි'. පැහැදිලි කරන්න.

   ii පුරුෂාධිපත්‍යයෙහි පැවැත්ම පුරුෂයන් හා ස්ත්‍රීන් කෙරෙහි මෙන්ම මුලු මහත් සමාජය කෙරෙහි ද ඇති කරන සමාජ ආර්ථික බලපෑම සාකච්ඡා කරන්න.

3. ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි පැවැත්ම සංස්කෘතික වශයෙන් සාධාරණීකරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජය තුළ පිළිගැනීමට ලක් වූ සංස්කෘතික අංගයක් බවට පත්වන්නේ කෙසේදැයි උදාහරණ ඇසුරින් විමසන්න.

4. 'සමාජ පර්යේෂණ අත්‍යවශ්‍ය වශයෙන්ම විද්‍යාත්මක වන අතර පක්ෂග්‍රාහිත්වයන් සහ අගතීන් හි බලපෑම් වලින් තොර විය යුතුය'. සමාජ පර්යේෂණ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පදනම මත පැහැදිලි පක්ෂග්‍රාහිත්වයන්ගෙන් යුක්ත විය හැක්කේ කෙසේදැයි මාග්‍රට් අයික්ලර් ගේ අදහස් ඇසුරින් සාකච්ඡා කරන්න.

5. ස්ත්‍රීන් විසින් එදිනෙදා ජීවිතය තුළ නිර්මාණය කරන දැනුම සාමාජීය වශයෙන් පිළිගත් දැනුම් ප්‍රභේදයන්ගෙන් බහිෂ්කරණය වන්නේ කෙසේදැයි ස්ත්‍රීවාදී ඥාණ මීමංසාව පිළිබද ක්ෂේත්‍රය තුළ මතුවී ඇති අදහස් ඇසුරින් විමසන්න.

6. 'ලොව පුරා සමාජයන් විසින් යොදා ගැනෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ගොඩ නැගුණු සමාජානුයෝජන ක්‍රියාවලීන් හා පෞරුෂ සංවර්ධන විධි ක්‍රම හේතුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිජේදනාත්මක ප්‍රතිවිපාක ප්‍රධාන වශයෙන්ම අත්විදීමට සිදුවන්නේ ස්ත්‍රීන්ටය'. ඔබ මෙම ප්‍රකාශය සමග එකහ වන්නේ ද? ඔබේ පිළිතුර උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

*************